# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1832/17 – 2013 ඔක්තෝබර් 15 වැනි අඟහරුවාදා – 2013.10.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නවදුන් කෝරළේ මැද පත්තුව සුළු කොට්ඨාසයේ, දෙමනගම්මන ගමේ (අ.ග.පි. 16) පිහිටි රත්නපුර දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කර ඇති අංක ආර්/පීඑල්එම්/2012/1059 හා 2013.04.11 දිනැති ප්‍රගමන අනුරේඛණයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් පෙන්නුම් කර ඇති පීල්ලදෙනිය වත්ත නමැති ප්‍රමාණයෙන් හෙක්. 0.1182 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

කැබලි අක්ෂර 'ඒ' – පීල්ලදෙනිය වත්ත – ප්‍රමාණය: හෙක්. 0.1182 ක් පමණ

උතුරට: ප්‍රාදේශීය සභා මාර්ගය සහ ඇළ; නැගෙනහිරට: ඇළ; දකුණට: ප්‍රාදේශීය සභා මාර්ගය, ආර්. එම්. ලූවිස් සිංඤෝ හිමිකම් කියන අන්නත්තාගල හේන සහ කේ. පී. ආර්. විජේතිලක හිමිකම් කියන පීල්ලදෙනිය වත්ත; බටහිරට: කේ. පී. ආර්. විජේතිලක හිමිකම් කියන පීල්ලදෙනිය වත්ත සහ ප්‍රාදේශීය සභා මාර්ගය.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: 4-3/8/2012/පීසී/301.
2013 අගෝස්තු මස 28 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 – 79

1A – G 018397 – 160 (2013/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*සැ.යු.– මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත හැකිය.*